# වරකාපොල ප්‍රාදේශීය සභාව
# ප්‍රසම්පාදන ( ටෙන්ඩර් ) දැන්වීමයි.

## වරකාපොල සතිපොල භූමියේ ඉදිකරන ලද නව කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ අංක 08 සිට 14 දක්වා වන කඩ කාමර 07 දීර්ඝ කාලීනව බදු පදනම යටතේ 2023 වර්ෂයේ සිට වසර 30 කාලසීමාවක් සඳහා බදු දීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(Xii) වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් කඩ කාමර දීර්ඝ කාලීනව බදු දීම පිණිස මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2022.1**1.28 දින පෙ.ව 10.00 දක්වා** මා විසින් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර **2022.11.08** දින සිට **2022.11.25** දින **ප.ව** 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.ඒ සඳහා කරනු ලබන ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.

නියමිත ගාස්තු ගෙවා ලබා ගනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර අයදුම්පත් දෙකකින් යුතුව සම්පූර්ණ කොට මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම කවර වල බහා එහි වම් පස ඉහළ කෙළවරේ **˜වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ කඩ කාමර අංක ...... සඳහා මිළ ගණන් ˜** (තිත් ඉරමත අදාළ කඩ කාමර අංකය සඳහන් කරන්න) ලෙස අනිවාර්යෙන් සඳහන් කර ලියුම් කවර 02 ක බහා මුද්‍රා තබා **2022.11.28** වන දින **පෙ.ව 10.**00 ට පෙර අතින් ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

ටෙන්ඩර් විවෘත කිරීම **2022.11.28 වන දින පෙ.ව10.30 ට** සිදු කෙරේ. ටෙන්ඩර් කොන්දේසි හා වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

2022.11.04
වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.
දුරකථන අංකය : 035-2267275

එන්.සරත් සුමනසූරිය
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව

### වරකාපොල සතිපොල භූමියේ කඩ කාමරවල ඉහල මාලයේ කඩ කාමර

| අනු අංකය | ස්ථානය | ආකෘති පත්‍ර ගාස්තුව | ටෙන්ඩර් ඇප මුදල (රුපියල්) | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 08 | 1500.00 | 16800.00 | 840000.00 |
| 02 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 09 | 1500.00 | 16800.00 | 840000.00 |
| 03 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 10 | 1500.00 | 16800.00 | 840000.00 |
| 04 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 11 | 1500.00 | 16800.00 | 840000.00 |
| 05 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 12 | 1500.00 | 16800.00 | 840000.00 |
| 06 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 13 | 1500.00 | 16800.00 | 840000.00 |
| 07 | වර/සති/ඉහළ මාලයේ කඩ කාමර අංක 14 | 1500.00 | 16800.00 | 840000.00 |

වරකාපොළ ප්‍රාදේශීය සභාව
வரகாபொல பிரதேச சபை
Warakapola Pradeshiya Sabawa